විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම

# ඇබෑර්තු නිවේදනය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයට අනුබද්ධිත පූර්ණ රජය සතු සමාගමක් වන අතර, එය විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම, පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ක්‍රියාශීලී, කැපවූ, යෝග්‍ය සුදුසුකම්ලත් සහ පළපුරුදු අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. විදේශ රැකියා බඳවා ගැනීම් සහ ගුවන් ටිකට්පත් මෙහෙයුම් පිළිබඳ පළපුරුද්ද අමතර වාසියකි.

**ඇබෑර්තු ලේඛනය**

| අනු අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | වයස් සීමාව | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | සාමාන්‍යාධිකාරී | 01 | HM 1-3-2025, රු. (152,500-15X4,100-214,000.00) | අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. | එක් එක් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ කාර්යය විෂය පථය www.slfea.lk වෙතින් බාගත කරගත හැක. |
| 02 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 01 | HM 1-1-2025, රු. (140,640-15X4,100-202,140.00) | | |

**වැටුප :**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි විධිවිධානයන්ට අනුව, ඉහත වැටුප් පරිමාණයට ඇති හිමිකම පත්වීම් දින සිට ක්‍රියාත්මක වේ. අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන වැටුප් වර්ධකවලට අනුකූලව, අදාළ පත්වීම් වර්ෂය සඳහා එම තනතුරුට නියමිත වැටුප සමග රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ**

- ➢ නිල වාහන හිමිකම – ඉන්ධන සහිතව.
- ➢ වෘත්තීය දීමනාව
- ➢ ජීවන වියදම් දීමනාව
- ➢ පැමිණීමේ දීමනාව
- ➢ වෛද්‍ය රක්ෂණය

**තෝරාගැනීමේ ක්‍රමවේදය**

ඉහළම සුදුසුකම් සහ ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයෙහි කාර්යය සාධනය මත තෝරාගනු ලැබේ.

**පත්කිරීමේ ස්වභාවය**

සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හිමිකම් සහිත ස්ථිර පත්වීමකි.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

මෙම නිවේදනයෙහි සඳහන් සුදුසුකම් සපුරාලන සහ පත්කිරීම් බලධාරියා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සුදුසුකම් ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකින් උපරිම සමස්ත ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා බඳවා ගැනීමට තෝරාගනු ලැබේ. මෙම සුදුසුකම් ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය (SOR) අනුව ලකුණු ලබාදීමේ ක්‍රමවේදයට අනුකූලව පවත්වනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවීමේ දිනය SLFEA හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

**පොදු අවශ්‍යතා සහ තොරතුරු**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- තනතුරෙහි රාජකාරී මැනවින් ඉටුකිරීම සඳහා යෝග්‍ය කායික හා මානසික තත්ත්වයක් තිබිය යුතුය.
- අයදුම් කරනු ලබන තනතුර කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.
- අයදුම්පත් ආකෘති පත්‍ර SLFEA වෙබ් අඩවිය (www.slfea.lk) වෙතින් බාගත කරගත හැක.
- එක් එක් තනතුර සඳහා අදාළ වන සුදුසුකම් SLFEA වෙබ් අඩවිය (www.slfea.lk) වෙතින් බාගත කරගත හැක.
- තෝරාගනු ලැබුවහොත් SLFEA විසින් සඳහන් කරනු ලබන දිනයේදී රාජකාරී භාරගැනීම සඳහා අයදුම්කරු වගකීමෙන් බැඳී සිටියි.
- ඉහත තනතුරු ඇබෑර්තු පිරවීමේ හෝ පුරප්පාඩුව පවත්වාගැනීමේ අයිතිය ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම සතුවේ.
- වයස් සීමාව, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සලකා බැලේ.

මේ පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන් සියලුම අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත් සමග ඔවුන්ගේ අයදුම්පත් (SLFEA අයදුම්පත) 2026 ජූනි 15 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අවසන් දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම,**
**අංක 12, නාරාහේන්පිට පාර, නාවල.**

**දුරකථන : +94112807400, ෆැක්ස් : +94112808200**
**ඊමේල් : gm@slfea.lk**